ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

## පුවත්පත් නිවේදනය

## <u>නව වන මිත්‍ර ශක්ති අභ්‍යාසය සාර්ථකව නිමා වේ</u>

ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර වාර්ෂිකව පැවැත්වෙන ද්විපාර්ශවික මිත්‍ර ශක්ති අභ්‍යාසය 9 වන වරටත් 2023 නොවැම්බර් 16-23 දක්වා ඉන්දියාවේ පූනේ හි විදේශ පුහුණු මධ්‍යස්ථානයේ දී පැවැත්විණ.

ඉන්දියානු බලඇණිය මරාතා සැහැල්ලු පාබල රෙජිමේන්තුවේ සාමාජිකයන් 120 දෙනෙකුගෙන් ද ඉන්දීය ගුවන් හමුදාවේ ගුවන් විරුවන් සහ නිලධාරීන් 15 දෙනෙකුගෙන් ද සමන්විත විය. ශ්‍රී ලංකා පාර්ශවය 53 වන පාබල සේනාංකයේ සාමාජිකයන් 117 දෙනෙකුගෙන් ද ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ 06 දෙනෙකුගෙන් ද සමන්විත විය. ශ්‍රී ලංකා බලඇණිය මෙම අභ්‍යාසය සඳහා පූනේ වෙත ගෙනඒම සඳහා IAF IL – 76 ගුවන්යානය යොදවා තිබිණ.

මිත්‍ර ශක්ති IX අභ්‍යාසය සඳහා ප්‍රථම වරට දෙරට යුධ හමුදාවන්ට අමතරව ගුවන් හමුදාවන් ද සහභාගී වූහ. මේ අනුව මෙවර ප්‍රථම වරට මිත්‍ර ශක්ති අභ්‍යාසය ද්වි සේවා අභ්‍යාසයක් වශයෙන් පැවැත්විණ. මිත්‍ර ශක්ති - VIII හි සාර්ථකත්වය මත පදනම්ව එය ඒකාබද්ධ හමුද සංකල්පයක සිට ද්වි සේවා මට්ටම දක්වා ඉහළ නංවන ලදී. මෙය ත්‍රස්තවාදය ඇතුළු පොදු තර්ජනයන්ට සාර්ථකව මුහුණ දීම සඳහා දෙරට අතර අඛණ්ඩව වර්ධනය වන ආරක්ෂක සහයෝගීතාවය පිළිඹිබු කරයි.

මෙයට අමතරව, මිත්‍ර ශක්ති - IX අභ්‍යාසය සඳහා ඩ්‍රෝන සහ හෙලිකොප්ටර්වලට අමතරව මිනිසුන් රහිත ගුවන් වාහන හඳුනාගත

හැකි සහ විනාශ කළ හැකි ගුවන් පද්ධතීන් යොදවා තිබීම ද සුවිශේෂත්වයකි. හමුදා සටන් කලා වැඩසටහන්, ප්‍රහාරක ප්‍රතීක වෙඩිතැබීම් සහ යෝගා යනාදිය ද අභ්‍යාසයේ විෂය මාලාවට ඇතුළත් විය. මෙවර අභ්‍යාසය සඳහා දෙරටම නියෝජනය කරමින් කාන්තා නිලධාරීන් සහ සෙබළියන් ඇතුළත් වීම ද විශේෂත්වයකි.

මිත්‍ර ශක්ති අභ්‍යාසය කලාපය තුළ වාර්ෂිකව පවත්වන විශාලතම ද්විපාර්ශවික අභ්‍යාසයක් වන අතර එය ඉන්දියාවේ සහ ශ්‍රී ලංකාවේ මාරුවෙන් මාරුවට පැවැත්වේ. මෙම අභ්‍යාසය ජාත්‍යන්තර සාමය සහ ආරක්ෂාවට පවතින තර්ජනයන්ට මුහුණ දීම සඳහා හමුදා බලය යෙදවීම ඇතුළු බලාත්මක පියවර ගැනීම සඳහා ආරක්ෂක කවුන්සිලයට බලය ලබා දෙන එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියේ VII වන පරිච්ඡේදය යටතේ උප සම්ප්‍රදායික මෙහෙයුම් ඒකාබද්ධව පුහුණු වීම සඳහා පැවැත්වේ. මෙම අභ්‍යාසය දේශසීමාවන්ට ඔබ්බෙන් ක්‍රියාත්මක ත්‍රස්තවාදය මැඩපැවැත්වීම, ඒකාබද්ධ උපායමාර්ගික මෙහෙයුම් පැවැත්වීම සහ සටන් කුසලතා ගොඩනැගීම යනාදිය සම්බන්ධයෙන් ප්‍රවීණත්වය ගොඩනැගීමට ඉවහල් වේ. එසේම, එය ඉන්දියාවේ "අසල්වැසි යා ප්‍රථමයෙන්" යන ප්‍රතිපත්තිය සහ "කලාපයේ සැමට ආරක්ෂාව සහ වර්ධනය" යන දැක්ම අනුව දෙරට හමුදාවන් අතර කාර්ය සහයෝගීතාවය සහ අන්‍යෝන්‍ය අවබෝධය ඉහළ නැංවීමට ද උපකාරී වේ.

***

***කොළඹ***
***2023 නොවැම්බර් 30***